*සැ. යු.-* 2013.10.25 දින පළ වූ අංක 1,834 දරන *ගැසට් පත්‍රයේ* I:III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,835 - 2013 නොවැම්බර් මස 01 වැනි සිකුරාදා - 2013.11.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 2116 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 2123 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 2126 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 නොවැම්බර් මස 22 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 නොවැම්බර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## නවගත්තේගම ප්‍රාදේශීය සභාව

### නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ තනතුරු පුරප්පාඩු

නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවත්නා පහත සඳහන් තනතුරුවලට සුදුස්සන් තෝරා පත් කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති නවගත්තේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු ගණන | වැටුප් ක්‍රමය මාසික | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | සෞඛ්‍ය කම්කරු | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතු ය. |
| 02. | මාර්ග කම්කරු | 05 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයයන් 2ක් වත් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර) (දැනට අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමෙන් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලිකවන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.) |
| 03. | නල ළිං පොම්ප කාර්මික | 01 | රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 | *බාහිර අයදුම්කරුවන් සඳහා —* අ.පො.ස. සා/පෙළ විභාගයෙන් විෂයයන් 2ක් වත් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර) *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා –* පළාත් සභා රාජ්‍ය සේවයේ නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතු ය. (දැනට අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමෙන් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.) *වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* : 01. තනතුරට අදාළව වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ N. V. Q. 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම; *සහ* 02. මෙම ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර රජයේ ආයතනයක /රාජ්‍ය සංස්ථා මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක වසර 02ට වැඩි කාලයක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබීම. (සහතිකයක් මගින් සනාථ කළ යුතු යි.) |
| 04. | විදුලි කාර්මික | 01 | රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 | *බාහිර අයදුම්කරුවන් සඳහා –* අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 2කට සම්මාන සහිතව විෂයයන් 6ක් වත් සමත් වී තිබිය යුතු ය. අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 5ක් සමත් විය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර) |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු ගණන | වැටුප් ක්‍රමය මාසික | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා —*<br><br>පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතු ය. (දැනට අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමෙන් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.)<br><br>*වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :*<br><br>1. තනතුරේ කාර්යය භාරයට අදාළව තෘතිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන N. V. Q. 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම;<br><br>*සහ*<br><br>2. පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්දක් තිබීම (සේවා සහතික මගින් සනාථ කළ යුතුයි.) |
| 05. | රියදුරු | 02 | රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 | *බාහිර අයදුම්කරුවන් සඳහා –*<br><br>අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 2ට සම්මාන සහිතව විෂයයන් 6ක් වත් සමත් වී තිබිය යුතු ය. අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 5ක් සමත් විය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර)<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා –*<br><br>පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතු ය. (දැනට අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමෙන් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලිකවන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.)<br><br>*වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :*<br><br>1. තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය. ( A පන්තියේ රියදුරු බලපත්‍රයක්);<br><br>*සහ*<br><br>2. වාහන රියදුරෙකු වශයෙන් වසර 3 ක පළපුරුද්දක් තිබිය යුතුයි. (සේවා සහතික මගින් සනාථ කළ යුතුයි.) |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම්.—*

1. අයදුම්පත් බාරගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනට වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.);
2. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතු ය;
3. අයදුම්කරු නවගත්තේගම ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ තුන් අවුරුද්දකට නොඅඩු කාලයක ස්ථිර පදිංචිකරුවෙක් විය යුතු ය. (වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතු ය.);
4. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය;
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙක් නොවිය යුතු ය;
6. පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම යටතේ දැනට සේවයේ නියුතු නිලධාරීන්ට ද ඉහත තනතුරු සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වන වසර 5ක කාලය තුළ වරදකට (අවවාද කිරීමක් හැර) දඬුවමක් ලබා නැත්තා වූ ද මෙම කාලය තුළ සියලු වැටුප් වර්ධක නියමිත දිනට ලබා ගත්තා වූ ද සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු ය.
7. අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය;
(ii) වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය;
(iii) පත් වීම අවුරුදු 3ක පරිවාස කාලයකට යටත් වන්නේය;
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද. රජය හෝ පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතු ය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

01. අවශ්‍යතාවය අනුව ලිඛිත/ව්‍යුහගත හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ;
02. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික පත්වල සහතික කළ පිටපත් අමුනා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය;

   *(අ)* උප්පැන්න සහතිකය,
   *(ආ)* අධ්‍යාපන සහතික.

03. තම පදිංචිය සහතික කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;
04. මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත් සහතිකයක් විය යුතු ය.);
05. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම් එම සහතික;
06. රියදුරන් බඳවා ගැනීමේ දී දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයකු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයකු හා පොලිස් රථවාහන අංශයේ නිලධාරියකු හෝ සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
07. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ;
08. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2013.11.15 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, නවගත්තේගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවර අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

එච්. එම්. එස්. හේරත්,
ලේකම්,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2013 ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

*නවගත්තේගම ප්‍රාදේශීය සභාව*

.........................................................*තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග : ——————.
මුලකුරුවලින් හැඳින්වෙන නම්: ——————.
02. තැපැල් ලිපිනය: ——————.
03. උපන් දිනය:
වර්ෂය : —————. මාසය: —————. දිනය: —————.
04. අයැදුම්පත භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු: —————. මාස: —————. දින: —————.
05. ජාතික හැඳුනුම්පත් අංකය : ——————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය: ——————.
07. විවාහක/අවිවාහක භාවය: ——————.
08. ජාතිය: ——————.
09. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද?/ලියාපදිංචිවීමෙන් ද? යන වග : ——————.
10. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න.):——————.
11. ඔබ දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත ද? එසේ නම් තනතුර, සේවා ස්ථානය සහ එම පත්වීමේ ස්වභාවය ස්ථිර/අනියම්/තාවකාලික : ——————.
12. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්: ——————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය වුවහොත් හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:—————

13. *ආයතන ප්‍රධානියාගේ සහතිකය:*

(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන අයදුම්කරුවන් සඳහා)

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන........................මහතා/මහත්මිය/මෙනවිය................................වැනි දින සිට මෙම කාර්යාලයේ ....................................ස්ථිර/තාවකාලික/අනියම්/කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම සහ හැසිරීම සතුටුදායක බවත්, ඉහත 1 සිට 8 දක්වා සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් 2013 .......................මස................වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

——————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : ——————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම: ——————.
පදවිය : ——————.
ලිපිනය : ——————.

11-26

## අගලවත්ත ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ අගලවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු අනියම් තාවකාලික ආදේශක සේවකයින් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක | 01 | PL-1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 - රු. 17,600 | අධ්‍යයන පොදු සහතිකපත්‍ර සා/පෙළ විභාගයේදී එක් වරකදී කවර හෝ විෂයයන් 06 ක් සමත් විය යුතුය. |
| 02 | රියැදුරු | 01 | PL-3 - 2006A රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 | අවම වශයෙන් 8 ශ්‍රේණිය - 9 ශ්‍රේණිය සමත් විය යුතුය. |

*වෘත්තීය හා වෙනත් සුදුසුකම්*

(අ) පෞද්ගලික - කුලී රථ හා තාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතු යි.

(ආ) රියැදුරු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසුව රියැදුරකු වශයෙන් වසර 3 ක පලපුරුද්දක් තිබිය යුතු අතර සහතික මගින් සනාථ කළ යුතු යි.

(ඇ) අවම වශයෙන් උස අඩි 5 ක් විය යුතු ය.

(ඈ) දිවා කාලයේදී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස මනා ශරීර සෞඛ්‍ය තත්වයක් තිබිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.

(ඉ) මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.

02. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු යි.
(ii) අයදුම්කරු අයැදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු යි.
(iii) අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවම වශයෙන් වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු යි.
(iv) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතු යි.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් හා දඬුවම් ලැබූවකු නොවිය යුතු යි.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන අයදුම්කරුවන්ගෙන් අධ්‍යාපන සුදුසුකම් සහ වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

04. *අයැදුම්පත් ඉදිරිපත් කිරීම .—*

I. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2013.11.10 හෝ එදිනට පෙර "ලේකම් ප්‍රාදේශීය සභාව අගලවත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

II. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ අදාල තනතුර සඳහන් කර "............................. තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර අයදුම්පත එවිය යුතුයි.

III. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය;
(ආ) අධ්‍යාපන සහතික;
(ඇ) පාසලෙන් අස්වීමේ සහතිකය;
(ඈ) පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය; (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුයි)
(ඉ) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්;
(ඊ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික;
(උ) රියදුරු බලපත්‍රයේ පිටපතක්.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඒ. ආර්. පොතුවිල,
ලේකම්,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 10 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය සභාව,
අගලවත්ත.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***අගලවත්ත ප්‍රාදේශීය සභාව***

*අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ................................තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග : ——————.
02. මුලකුරුලින් හැඳින්වෙන නම් : ——————.
03. ස්ථිර ලිපිනය : ——————.
04. ග්‍රාම නිලධාරි කොට්ඨාසය : ——————.
05. දිස්ත්‍රික්කය : ——————.
06. උපන් දිනය අවුරුද්ද : —————. මාසය : —————. දිනය : —————.
07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2013.11.10) වයස ඃ අවුරුදු : ——————.මාස : ——————.දින : ——————.
08. ස්ත්‍රී/පුරුෂ භාවය : ——————.
09. විවාහකද/අවිවාහකද යන වග : ——————.
10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග : ——————.
11. ජාතික හැඳුනුම්පත් අංකය : ——————.
12. අධ්‍යාපන සුදුසුකම් :
අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වර්ෂය හා විභාග අංකය : ——————.

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

27. වෘත්තීය හා වෙනත් සුදුසුකම්: ——————.

28. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ආදේශක/අනියම් ලෙස සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර : ——————.

එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමාන පදනම මතද යන වග)

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————.

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

.................................................................. මහතා/මහත්මිය මෙම ආයතනයේ ............................................................... වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

11-30

---

**සොරණාතොට ප්‍රාදේශීය සභාව**

ඌව පළාත් රාජ්‍ය සේවයේ ක්ෂේත්‍ර කම්කරු තනතුරු පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීම

පළාත් පාලන කොමසාරිස් (ඌව) ගේ අංක 12/ආ/03/06/02 හා 2013.09.25 දිනැති ලිපිය අනුව සොරණාතොට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින ක්ෂේත්‍ර කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පුරප්පාඩු සංඛ්‍යාව 01 යි
2. සුදුසුකම් :
   * අවම වශයෙන් 8 වන ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය
   * අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2013.11.08) වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
   * පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
   * මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටින අයෙකු විය යුතුය.
   * ඌව පළාතේ වසර 03 ක ස්ථිර පදිංචිය තිබිය යුතුය.
   * අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් එවිය යුතුය.

   (I) උප්පැන්න සහතිකය,
   (II) මෑත දී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකය,
   (III) අධ්‍යාපන සහතික.
3. තෝරා ගනු ලබන ක්‍රමය:
   * ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්
4. පොදු කොන්දේසි —

   I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතුය.

   II. අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
5. වැටුප් ක්‍රමය : රා. පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 A (PL 1 - 2006 A)
6. මෙම නිවේදනය සමග ඇති අයදුම්පත අනුව සකස් කරන ලද අයදුම්පත් 2013.11.08 වැනි දිනට පෙර ලැබෙන සේ "සභා ලේකම්, සොරණාතොට ප්‍රාදේශීය සභාව, දූංහිඳ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ආර්. එම්. උබේසේකර,
සභා ලේකම්,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 08 වැනි දින,
සොරණාතොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**සොරණාතොට ප්‍රාදේශීය සභාව**

.............................. ***තනතුරු සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග):——————.
2. මුලකුරු වලින් හැඳින්වෙන නම:——————.
3. තැපැල් ලිපිනය:——————.
4. උපන් දිනය වර්ෂය:————. මාසය:————. දිනය:————.
5. විවාහක/අවිවාහක බව:——————.
6. ජාතිය:——————.
7. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද? යන වග :——————.
8. පදිංචි ග්‍රාමසේවා වසම හා අංකය:——————.
9. අධ්‍යාපන සුදුසුකම්:——————.
10. වෘත්තීය සුදුසුකම්:——————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු කිසිවක් අසත්‍ය ඒවා හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————.

11-81

---

සංශෝධනයයි

**ජා-ඇල ප්‍රාදේශීය සභාව**

2013.09.27 දිනැති රජයේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ පළ වූ ජා ඇල ප්‍රාදේශීය සභාවේ ආයතනගත තනතුරු සඳහා බඳවා ගැනීමේ ගැසට් නිවේදනය සංශෝධනය කිරීම

උපලේඛනයේ අංක 01 යටතේ රියදුරු 11 ආ තනතුර සඳහා බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් පහත පරිදි සංශෝධනය විය යුතුය.

දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයන් 06ක් සමත් වීම. (එක් වරකදී අවම වශයෙන් විෂයන් 05ක් සමත් ව තිබිය යුතුය.)

එසේම අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2013.11.08 දක්වා දීර්ඝ කෙරේ.

එල්. ඒ. මංජුලා සමන්ති.
ලේකම්,
ජා ඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

2013 ඔක්තෝබර් මස 15 වැනි දින,
ජා ඇල ප්‍රාදේශීය සභාවේ දී ය.

11-82

# පළාත් පාලන නිවේදන

## කැස්බෑව නගර සභාව

2014 වර්ෂය සඳහා වරිපනම් බදු

(255 වැනි අධිකාරිය වන) නගර සභා ආඥා පනතේ 160 වැනි වගන්තියෙන් කැස්බෑව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කැස්බෑව නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල, 2014 වාර්ෂික වටිනාකම සඳහා 2002 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2014 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත නගර සභා ආඥා පනතේ 160 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර—

කුඹුරු ඉඩම් හා වෙළඳ හෝ වාණිජමය දේපල හැර අනෙකුත් දේපල වල එකී වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%); සහ

වෙළඳ හෝ වාණිජමය කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන වලින් එකී වාර්ෂික වටිනාකමින් සියයට දහයක (10%)

වරිපනම් බද්දක් 2014 වර්ෂය සඳහා පනවා අයකිරීමට කැස්බෑව නගර සභාව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

01. මෙම වරිපනම් බදු පිළිවෙලින් මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 සහ දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම සමාන කොටස් හතරකින් හෝ සම්පූර්ණයෙන් එකවර හෝ ගෙවිය හැක.

02. 2014 වර්ෂයට නියමිත සම්පූර්ණ වරිපනම් බදු මුදල් 2014.01.31 වැනි දින හෝ ඊට පෙර ගෙවන්නේ නම් , 10% ක වට්ටමක් දෙනු ලැබේ.

03. එක් එක් කාර්තුවට නියමිත මුදල අදාල කාර්තුවේ පළමු මස තුළ ගෙවනු ලැබුවහොත් 5% ක වට්ටමක් දෙනු ලැබේ.

04. ඉහත 1 ඡේදයේ සඳහන් දිනයන්ට ප්‍රථම වරිපනම් බදු මුදල් ගෙවනු නොලැබුවහොත් එක් එක් කාර්තුව සඳහා ගෙවිය යුතු වරිපනම් බදු මුදලින් නේවාසික ස්ථාන සඳහා 15% ක්ද, වාණිජ දේපළ සඳහා 20% ක් ද, වශයෙන් වරෙන්තු ගාස්තු අය කරනු ලැබේ.

ලක්ෂ්මන් පෙරේරා,
සභාපති,
කැස්බෑව නගර සභාව.

2013 සැප්තැම්බර් මස 30 වැනි දින,
කැස්බෑව නගර සභාව,
පිළියන්දල.

11-134

---

## කොළඹ මහ නගර සභාව

ගෝ ඝාතක ආඥා පනතේ 272 අධිකාරයේ 17(1) වගන්තිය යටතේ මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, කොළඹ මහ නගර සභාවේ නගරාධිපති වන මා විසින් 2014 වර්ෂය තුළ මෙහි පහත පළමු වැනි උපලේඛනයෙහි හා දෙවැනි උපලේඛනයෙහි සඳහන් දිනයන්හි දී ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝග අනුව වැසිය යුතු දිනයන්හි දී ද කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ මස් පිණිස සතුන් මැරීම, මස් විකිණීම, මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කොට තැබීම හා මස් වර්ග විකුණනු ලබන ස්ථාන විවෘත කොට තැබීම සපුරා තහනම් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

අහමඩ් ජමල්ඩීන් මොහොමඩ්, මුසම්මිල්,
නගරාධිපති,
කොළඹ මහා නගර සභාව.

2013 ඔක්තෝබර් මස 10 වැනි දින,
නගර ශාලාව,
කොළඹ 07.

පළමු වැනි උපලේඛනය

| | |
|---|---|
| ජනවාරි | 15 - දුරුතු මස පුර පසළොස්වක පෝය දිනය |
| පෙබරවාරි | 14 - නවම් මස පුරපසළොස්වක පෝය දිනය |
| මාර්තු | 16 - මැදින් මස පුරපසළොස්වක පෝය දිනය |
| අප්‍රියෙල් | 14 - බක් මස පුරපසළොස්වක පෝය දිනය |
| මැයි | 14 - වෙසක් මස පුරපසළොක්වක පෝය දිනය |
| මැයි | 15 - වෙසක් මස පුරපසළොස්වක පෝය දිනට පසු දින |
| ජූනි | 12 - පොසොන් මස පුරපසළොස්වක පෝය දිනය |
| ජූලි | 12 - ඇසළ මස පුරපසළොස්වක පෝය දිනය |
| අගෝස්තු | 10 - නිකිණි මස පුරපසළොස්වක පෝය දිනය |
| සැප්තැම්බර් | 08 - බිනර මස පුරපසළොස්වක පෝය දිනය |
| ඔක්තෝබර් | 08 - වප් මස පුරපසළොස්වක පෝය දිනය |
| නොවැම්බර් | 06 - ඉල් මස පුරපසළොස්වක පෝය දිනය |
| දෙසැම්බර් | 06 - උඳුවප් මස පුරපසළොස්වක පෝය දිනය |

දෙවන උපලේඛනය

| | |
|---|---|
| පෙබරවාරි | 04 - ජාතික නිදහස් දිනය |
| මැයි | 01 - ලෝක කම්කරු දිනය |
| ඔක්තෝබර් | 04 - ලෝක සත්ත්ව දිනය |

11-54

---

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

සංවර්ධනය නොකළ ඉඩම් විෂයයෙහි බදු අය කිරීම - 2013 වර්ෂය සඳහා

### යෝජනා කෙටුම්පත

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරය වන මහනගර සභා ආඥා පනත මගින් පැවරී ඇති බලතල අනුව මහ නගර සභා ආඥා පනතේ 247 (ඇ) යන වගන්ති යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් 2013 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් විෂයයෙහි බදු අය කිරීම.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා සුදුසු වන විටෙක හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටෙක හෝ මෙම සභාවේ මතය අනුව යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි විටෙක –

(අ) ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්; හෝ

(ආ) ඒ ඉඩමෙන් ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය යෝජනා සම්මතයක් මගින් සභාව විසින් නියම කරනු ලැබූ නියමිත අනුපාතයට වඩා අඩුනම්; හෝ

(ඇ) ස්ථාවර නැතහොත් නිතිපතා කෙරෙන ගොවිතැනට ඒ ඉඩම යොදවා නැත්නම්;

එම ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකක ප්‍රමාණයක බද්දක් ඒ ඉඩමේ අයිතිකරු විෂයයෙහි වාර්ෂිකව නියම කළ යුතු ය.

2013 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහ නගර සභාවේ අංක 06 : 01 දරන සභා තීරණය ප්‍රකාර 2013 වර්ෂයට සහ ඉන්පසුව කෙරෙන සංශෝධනයන් අදාළ පරිදි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් ඉහත සඳහන් පරිදි සංවර්ධනය නොකළ ඉඩම් විෂයයෙහි බදු පනවා අයකරන බව සියලු දෙනාගේම දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශාන්තා පී ලියනගේ,
ප්‍රධාන නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2013 ඔක්තෝබර් මස 22 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා කාර්යාලය,
රාජගිරිය.

11-197

## හපුතලේ නගර සභාව

### වරිපනම් බදු පැනවීම - 2014 වර්ෂය සඳහා

හපුතලේ නගර සභාව විසින් 2013 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 4:3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

255 වැනි අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 160 හා 166 වැනි වගන්ති ප්‍රකාර, හපුතලේ නගර සභාව විසින් කරනු ලැබිය හැකි විශේෂ කොන්දේසි යටතේ, නිදහස් කිරීම්වලට යටත්ව හපුතලේ නගර සභා බල ප්‍රදේශයේ පිහිටි;

01. සියලුම නිවාස සහ මුඩු ඉඩම් වලින් වාර්ෂික තක්සේරු වටිනාකමින් සියයට පහක (5%) වරිපනම් බද්දක් ද;

02. නිවාස සහ මුඩු ඉඩම් නොවන අනෙකුත් සියලු දේපළ වලින් වාර්ෂික තක්සේරු වටිනාකමින් සියයට දහයක (10%) වරිපනම් බද්දක් ද;

03. නගර සභා සීමාවේ පිහිටි රජය සහ සංස්ථා සතු දේපළවලින් වාර්ෂික තක්සේරු වටිනාකමින් සියයට දාහතරක (14%) වරිපනම් බද්දක් ද 2014 වර්ෂය සඳහා අයකරනු ලැබේ.

04. නගර සභා ආඥා පනතේ 160(5) වැනි වගන්තිය ප්‍රකාර 2014.01.31 දින ප. ව. 3.00 ට ප්‍රථම වර්ෂයට අදාල මුළු වරිපනම් බදු මුදල ගෙවීමෙන් සියයට දහයක (10%) වට්ටමක් ලබා දෙනු ලබන බව මෙයින් දන්වමි.

උපුල් දිසානායක,
සභාපති,
නගර සභාව,
හපුතලේ.

11-80

---

## බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව


### බුලත්කොහුපිටිය පන්නල කලාපය දියුණු ගම් ප්‍රදේශයක් බවට පත් කිරීම

2011 මැයි මස 26 වැනි දින පැවති බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ තීරණ අංක 05 යටතේ නව ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස නාගරික කලාපයක් බවට සංවර්ධනය කර දියුණු ගම් ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා පන්නල කලාපය සුදුසු බවට යෝජනා සම්මත කරගෙන ඇති අතර, ඒ සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය මගින් පවරා ඇති බලතල ප්‍රකාර බුලත්කොහුපිටිය සති පොළ ආසන්නයේ අංක 26/5 දරන බෝක්කුව අසල සිට බුලත්කොහුපිටිය - රුවන්වැල්ල පාරේ වැකඩ අංක 34/5 දරන බෝක්කුව දක්වා වූ කලාපයේ ප්‍රධාන මාර්ගය (බුලත්කොහුපිටිය - රුවන්වැල්ල මාර්ගය) මධ්‍යයේ සිට දෙපසට දම්වැල් 02 ක ප්‍රමාණය නව වරිපනම් බල ප්‍රදේශය ලෙසට (දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ) ප්‍රකාශයට පත් කර ඇති අතර අය කරනු ලබන වරිපනම් ප්‍රතිශතය 5%ක් බවත් බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභව වෙනුවෙන් ප්‍රකාශයට පත් කරමි.

එම කලාපයේ සිතියම පහත දැක්වේ.

ඩී. බී. වී. රුවන් සංජීව දියසුන්නත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
බුලත්කොහුපිටිය.

2013 ඔක්තෝබර් මස 08 වැනි දින,
බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ දී ය.


Environmental Map- Bulathkohupitiya Pradeshiya Sabha
Boundary
Contour
Hospital
School
Police Station
Post Office
Sub Post Office
Buddhist Temple
Hindu Temple
Utilities
Forest
Paddy
River
Rock
Tank
Water Hole
Main Road - A Class
Main Road - B Class
Minor Road
Jeep or Cart Track
N
to Kegalle
2 Kilometers
Sri lnka Institute of Local Governance

# විවිධ දැන්වීම්

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ වාරියපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2013 වර්ෂයෙහි අගෝස්තු මස 13 වන දින පවත්වන ලද වාරියපොල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරන අංක V යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, සහ දෙසැම්බර් 31, යන දිනවලින් අවසන් වන කාර්තු 04 තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බද්ද එම වර්ෂයේ ජනවාරි මස 31 දිනට ප්‍රථම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු වටිනාකමින් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාල වරිපනම් බද්ද එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

ආනන්ද ජයලත්,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2013 සැප්තැම්බර් මස 20 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

*(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (I) වන උප වගන්තිය යටතේ වාරියපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල පිහිටි සියළුම නිවාසවල ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල හා නිශ්වල දේපලවල 2014 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරුව 2014 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

*(ආ)* එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (I) වන උපවගන්තිය යටතේ වාරියපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර වාරියපොල ප්‍රාදේශීය සභාව මගින් දියුණුගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති එකී දේපල මත ඉහතකී වාර්ෂික වටිනාකමින් වාරියපොල නගර කොට්ඨාසයේත්, කටුපොත නගර කොට්ඨාසයේත් දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වාර්ෂික වරිපනම් බද්දක් ද;

පාදෙනිය, හංහමුණුව, රඹාවැව හා මහකෙළිය යන ප්‍රදේශයන්හි දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට දෙකක (2%) වාර්ෂික වරිපනම් බද්දක් ද වශයෙන් පනවා අයකළ යුතු බවටත්, එකී වාර්ෂික වටිනාකම්, දේපළවල භෞතික වෙනස්වීම් මත සංශෝධනය කළ යුතු බවටත් සහ ;

*(ඇ)* ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යථෝක්ත වාර්ෂික වරිපනම් බද්ද 2014 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු 04 තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතුයැයි විධාන කිරීමට සහ;

එකී බදු මුදල් එක් එක් කාර්තුව අවසානයේ දී නොගෙවනු ලබන අවස්ථාවකදී ව්‍යාපාරික ස්ථාන සඳහා සියයට විස්සක (20%) අධි ගාස්තුවක් ද, අනෙක් හිස් බිම් හා පදිංචි ස්ථාන සම්බන්ධයෙන් (15%)ක අධිගාස්තුවක් ද, අයකල යුතු බවට වාරියපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

11-27/5

---

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

බලපත්‍ර හා බදු පැනවීම - 2014 වර්ෂය

වාරියපොල ප්‍රාදේශීය සභාව විසින් 2013 අගෝස්තු මස 13 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභාසම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙම බද්දට යටත්වන කිසියම් පරිශ්‍රයක් පාවිච්චි කරන සෑම තැනැත්තෙකු විසින්ම එම පරිශ්‍රය පාවිච්චි කිරීම ආරම්භ කල දින සිට දින 30ක් ඇතුලත බලපත්‍ර ගාස්තුවක් ගෙවා බලපත්‍රයක් ලබා ගත යුතු බවට වැඩිදුරටත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආනන්ද ජයලත්,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2013 සැප්තැම්බර් මස 20 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තිය යටතේ වාරියපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2014 වර්ෂයේ නිකුත්

කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි වාරියපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය අංක 1

| | *I වන තීරය* | *II වන තීරය* | | |
|---|---|---|---|---|
| | *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 01 සිට රු. 750 දක්වා* | *රු. 751 සිට රු. 1,500 දක්වා* | *1,500 ට වැඩි* |
| *අනු. අංකය* | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 4. | ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 6. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ශීතකළ මස් වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | බිත්තර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 1,000 0 |
| 10. | මස් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | කුකුල් ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | උකස් ලියාපදිංචි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | අයිස් කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | සිසිල්බීම කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ඌරු කොටුවක් පවත්වාගෙන යාම (4ට වැඩි ප්‍රමාණයක්) | 300 0 | 600 0 | 1,000 0 |
| 17. | ඌරු කොටුවක් පවත්වාගෙන යාම (4ට අඩු ප්‍රමාණයක්) | 250 0 | 500 0 | 700 0 |
| 18. | ගව ගාලක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 1,000 0 |
| 19. | පොදු වෙළඳපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | පෞද්ගලික වෙළඳපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | තානායමක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

11-27/1

---

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

ලැගුම් නිවාස හා නවාතැන්පළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

වාරියපොල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 13 වැනි දින පවත්වන ලද වාරියපොල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක XII යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ අනුව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ලැගුම් නිවාස හා නවාතැන් පොලක කාර්ය සඳහා කිසියම් පරිශ්‍රයක් පාවිච්චි කරන සෑම තැනැත්තෙකු විසින් ම එම පරිශ්‍රය පාවිච්චි කිරීම ආරම්භ කල දින සිට දින 30ක් ඇතුලත ගාස්තුවක් ගෙවා බලපත්‍රයක් ලබා ගත යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ආනන්ද ජයලත්,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2013 සැප්තැම්බර් මස 20 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***යෝජනාව***

වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරන ලද 2011.01.18 දින වයඹ පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරන ලද බවට 2011.04.28 දිනැති අංක :1703/18 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටස මගින් ප්‍රකාශයට පත්කර ඇති ලැගුම් නිවාස හා නවාතැන් පොළවල් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව වාරියපොල ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක කළ යුතු බවට 2010.09.28 වැනි දින පැවැති මහ සභාව විසින් පිළිගෙන අංක 1714 හා 2011.07.08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසෙන් නිවේදනය කර ඇති අතර එම අතුරු ව්‍යවස්ථාව 2014 වර්ෂය තුළ වාරියපොළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ යුතු බව යෝජනා කරන්නී ය.

තව ද යම් ස්ථානයක්, හෝටලයක්, ආපනශාලාවක් හෝ නවාතැන්පලක කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන්නේ ද 1968 අංක 14 දරන සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ ද අනුමත කර හෝ පිළිගන්නාවූ ද අවස්ථාවක අයකළ යුතු ගාස්තුව අයකරනු ලැබූ අවුරුද්දට පෙරාතුව අවුරුද්දේ ආදායමින් 1% ක මුදලක් බදු වශයෙන් ගෙවා බලපත්‍රයක් ලබාගත යුතු වන්නේ ය.

11-27/12

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

*ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

වාරියපොල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 13 වැනි දින පවත්වන ලද වාරියපොල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී යෝජනා අංක VIII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බවත්,

ඒ අනුව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා වාරියපොල ප්‍රාදේශීය සභාවෙන් අවසර පත්‍රයක් ලබාගත යුතු බවත්, ඒ සඳහා මෙම සභාව විසින් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් අයකරනු ලබන බවත් මහජනතාව වෙත මෙයින් වැඩිදුරටත් නිවේදනය කරමි.

ආනන්ද ජයලත්,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2013 සැප්තැම්බර් මස 20 වෙනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22(4) හා 122-126 වැනි වගන්තිවලින් වාරියපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව 1988.08.23 දිනැති අංක 520/7 දරන පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු වාරියපොල ප්‍රාදේශීය සභාව විසින් 2014.01.01 වැනි දින සිට නැවත සංශෝධනය කරන තුරු පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

*උපලේඛනය*

| | I වැනි තීරුව<br>විස්තරය | | II වැනි තීරුව<br>අයකරන ගාස්තුව<br>රු. ශත |
|---|---|---|---|
| 01. | බිත්තියක හෝ තාප්පයක, පුවරුවක, ලෑල්ලක හෝ ආධාරකයක් මඟින් ප්‍රදර්ශනය කරන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා (සෑම වසරකම ගෙවිය යුතුය) | වර්ග අඩියකට | 60 0 |
| 02. | එක් මසකට වැඩි මාස 03කට අඩු කාල සීමාවක් සඳහා ප්‍රදර්ශනය කෙරෙන බැනරයක් සඳහා | වර්ග අඩියකට | 30 0 |
| 03. | මාස 01ක් හෝ ඊට අඩු කාලයක් සඳහා ප්‍රදර්ශනය කෙරෙන බැනරයක් සඳහා | වර්ග අඩියකට | 20 0 |
| 04. | කටවුට් සඳහා මාස 03කට වැඩි කාල සීමාවකට | වර්ග අඩියකට | 40 0 |
| 05. | කටවුට් සඳහා මාස 03කට අඩු කාල සීමාවකට | වර්ග අඩියකට | 30 0 |
| 06. | සභාව සතු වාරියපොල නගරයේ ඇති භූමිය තාවකාලික වෙළඳ කුටි, එළිමහන් ප්‍රදර්ශන පැවැත්වීම සඳහා කුලියට දීම (එක් දිනක් සඳහා) | වර්ග අඩියකට | 5 0 |
| 07. | චිත්‍රපට දර්ශන, ආධාර චිත්‍රපට දර්ශන, මැජික් සංදර්ශන, සර්කස් සංදර්ශන, නැටුම් සංදර්ශන හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම අලෙවි කරනු ලබන සෑම ප්‍රවේශ පත්‍රයකින්ම 10%ක බදු මුදලක් ගෙවිය යුතු ය. | | |
| 08. | ප්‍රසිද්ධ සංදර්ශන බලපත්‍ර ගාස්තුව (එක් දිනක් සඳහා) | | 500 0 |

11-27/8

---

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

*සේවා සඳහා ගාස්තු අයකිරීම*

වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2014 වර්ෂයට සේවා සැපයීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු නැවත සංශෝධනය කරන තුරු 2014.01.01 දින සිට පනවා අය කිරීමට 2013 වර්ෂයෙ හි අගෝස්තු මස 13 වැනි දින පවත්වන ලද වාරියපොල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී යෝජනා අංක IX යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ආනන්ද ජයලත්,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2013 සැප්තැම්බර් මස 20 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

"1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර බලපත්‍ර ගාස්තුව හා ප්‍රාදේශීය සභා පනතේ 49(7) වගන්තිය ප්‍රකාරව නොපවරා ගැනීමේ පරීක්ෂණ ගාස්තු ද, නිවාස හා නගර සංවර්ධන ආඥාපනතට අනුව හා ගෘහ හා නගර නිර්මාණ ආඥාපනත යටතේ පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2014 වර්ෂයට පනවා අය කළ යුතු යැයි යෝජනා කරන්නීය."

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| *විස්තරය* | *අයකරන ගාස්තුව* |
| | *රු. ශ.* |
| 1. පරිසර ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 500 0 |
| 2. පරීක්ෂණ ගාස්තුව | වටිනාකම අනුව |
| 3. බලපත්‍රය අළුත්කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 250 0 |
| 4. පරිසර බලපත්‍ර ගාස්තුව | 1,250 0 |
| 5. සියලුම නව ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා පෙරසැරි ගාස්තු : | වර්ග අඩි ප්‍රමාණය අනුව |

| *වර්ග ප්‍රමාණය* | *නිවාස* | *ව්‍යාපාර* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| වර්ග අඩි 2,000 දක්වා | 500 0 | 750 0 |
| වර්ග අඩි 2,000ට වැඩිවන සෑම වර්ග අඩි 100ක් සඳහාම | 100 0 | 200 0 |
| 6. අළුතින් ඉදිකරන තාප්ප සඳහා වර්ග අඩියකට | 2 0 | 4 0 |
| 7. වීථිරේඛා සහ නොපවරා ගැනීමේ සහතිකපත්‍ර ගාස්තුව | 600 0 | |
| 8. වීථි රේඛා පරීක්ෂණ ගාස්තුව | 500 0 | |
| 9. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව | 500 0 | |
| 10. ගොඩනැගිලි අයදුම්පත් පරීක්ෂා කිරීමේ ගාස්තුව | 500 0 | |

11. ගොඩනැගිලි ඉල්ලුම්පත්‍රවල වලංගු කාලය දීර්ඝ කිරීම
(උපරිම වසර 3 දක්වා)

| *කාලය* | *නිවාස* | *ව්‍යාපාර* |
|---|---|---|
| 1 වසර | 100 0 | 100 0 |
| 2 වසර | 100 0 | 200 0 |
| 3 වසර | 100 0 | 300 0 |

12. සභා බලප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් සඳහා දඩ මුදල් අයකිරීම :
(i) තාප්ප සඳහා - වර්ග අඩියකට පෙරසැරි ගාස්තුව මෙන් දෙගුණයක්
(ii) නගර සීමාව තුළ අනවසරයෙන් ඉදිකරන ලද ගොඩනැගිලි සඳහා ආවරණ අනුමැතිය දීමට ගාස්තු අයකිරීම :

| *විස්තරය (වර්ග මීටරයක් සඳහා)* | *නේවාසික* | *ව්‍යාපාර* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| (i) අත්තිවාරම සම්පූර්ණ කර ඇතිවිට | 25 0 | 25 0 |
| (ii) වහල මට්ටම දක්වා | 40 0 | 50 0 |
| (iii) වහලය ඇතුළුව නිවස ඉදිකොට ඇතිවිට | 60 0 | 100 0 |
| (iv) සම්පූර්ණයෙන් වැඩ නිමකොට ඇතිවිට | 100 0 | 150 0 |

13. අනුකූලතා සහතික නිකුත් කිරීම :
(සභා බල ප්‍රදේශය තුළ අළුතින් ඉදිකරන ලද ගොඩනැගිලි සඳහා)

| *වර්ග ප්‍රමාණය* | *නේවාසික* | *ව්‍යාපාර* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| (i) වර්ග මීටර් 270 දක්වා | 100 0 | 100 0 |

(ii) වැඩිවන සෑම වර්ග මීටරයකටම රුපියල (රු.1 ) බැගින් අය කෙරේ.

14. ඉඩම් කට්ටි සැලැස්ම හෝ අනුබෙදුම අනුමත කිරීමේ ගාස්තු අයකිරීම :

| *ප්‍රමාණය* | *සංවර්ධන සැලැස්ම* | *අනුබෙදුම* | *සේවා ගාස්තුව* |
|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| හෙක්ටයාර් 01ට අඩු | 250 0 | 250 0 | එක් කාර්යයක් සඳහා 750 0 බැගින් |
| හෙක්ටයාර් 01-02 | 350 0 | 350 0 | -එම- |
| හෙක්ටයාර් 02-04 | 500 0 | 500 0 | -එම- |
| හෙක්ටයාර් 04 ට වැඩි | 750 0 | 750 0 | -එම- |

15. සභා බල ප්‍රදේශයේ අනුමැතියට පෙර ඉදිකරන ලද සම්ප්‍රේෂණ කුළුණු සඳහා (කුළුනේ ධාරිතාව (කියුබික් මීටර් x200) යන පදනමින් දඩ මුදල් අයකරනු ලැබේ.

16. *ප්‍රාදේශීය සභාවේ වෙනත් ගාස්තු හා අයකුම :* :

| | | *රු. ශත* |
|---|---|---|
| (i) පුස්තකාල සාමාජික ගාස්තු : | වැඩිහිටි | 75 0 |
| | ළමා | 50 0 |
| (ii) පුස්තකාල අයදුම්පත් ගාස්තු | | 15 0 |
| (iii) පිඹුරුපත් අනුමත කිරීමේ ගාස්තු | | 500 0 |
| (iv) ටෙන්ඩර් දඩ | | 10% |
| (v) තක්සේරු ලේඛනයේ නම සංශෝධනය කිරීමේ ගාස්තු | | 30 0 |

17. වාහන හා යන්ත්‍ර සූත්‍ර කුලියට ලබාදීම :

| *අනු. අංකය* | *විස්තරය* | *මීටර් පැයකට අයකරන මුදල රු. ශත* |
|---|---|---|
| 01 | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය (ඉන්ධන සහිතව) | 4,150 0 |
| 02 | ඩෝසරය (ඉන්ධන සහිතව) | 4,250 0 |
| 03 | බැකෝ යන්ත්‍රය (ඉන්ධන සහිතව) | 2,100 0 |
| 04 | ටිපර් යන්ත්‍රය (කි. මී. 01ට) | 70 0 |
| 05 | ලොරි රථය (කි. මී. 01ට) | 70 0 |
| 06 | ට්‍රැක්ටරය (දිනකට) | 5,200 0 |
| 07 | කොන්ක්‍රීට් මිශ්‍රණය | 3,000 0 |

18. ජල බවුසරය සඳහා ගාස්තු :

| | *රු. ශත* |
|---|---|
| පාදෙනිය, කුරුණෑව, වේරපොල, ඇඹව, ගල්වැව හන්දිය, තිලක දසනායක මාවත දක්වා | 1,750 0 |
| අවුලේගම, මීනුවන්ගැටේ, රඹාවැව, මහකෙළිය දක්වා | 2,000 0 |
| ඊට වඩා දුර වැඩිවන විට | 2,250 0 |
| ජල බවුසරය දිනකට | 5,200 0 |

19. සතිපොළ සඳහා ගාස්තු අයකිරීම :

| | |
|---|---|
| (i) අඩි 8 x අඩි 6 ප්‍රමාණයේ කඩ කාමරයක් සඳහා | 175 0 |
| (ii) විවෘත භූමිය අඩි 08 x අඩි 06 සඳහා | 100 0 |

11-27/9

---

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

සංචාරක වෙළඳාම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව

වාරියපොල ප්‍රාදේශීය සභාව විසින් 2013 අගෝස්තු මස 13 වැනි දින පවත්වන ලද වාරියපොල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක XI යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආනන්ද ජයලත්,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2013 සැප්තැම්බර් මස 20 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරන ලද 2011.01.18 වෙනි දින වයඹ පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරන ලද බවට 2011.04.28 වැනි දිනැති අංක 1703/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) වැනි කොටසෙන් ප්‍රකාශයට පත් කර ඇති, සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ යුතු බවට 2010.09.28 වැනි දින පැවැති මහ සභාව විසින් පිළිගෙන අංක 1714 හා 2011.07.08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසෙන් නිවේදනය කර ඇති අතර එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2014 වර්ෂයට පනවා අයකළ යුතු යැයි වාරියපොල ප්‍රාදේශීය සභාව යෝජන කරන්නීය."

*උපලේඛනය*

| *I වැනි තීරය* *බලය දෙනු ලබන කාර්යය* | *II වැනි තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* *රු.01 සිට රු.750 දක්වා* *රු. ශත* | *රු.751 සිට රු.1,500 දක්වා* *රු. ශත* | *රු.1500 ට වැඩි* *රු. ශත* |
|---|---|---|---|
| *සංචාරක වෙළඳාම :* | | | |
| 01. තැඹිලි කුරුම්බා වෙළෙඳාම | 200 0 | 400 0 | 600 0 |
| 02. කඩල, වඩේ, මුරුක්කු, බයිට්ස් පැකට් විකිණීම | 200 0 | 400 0 | 600 0 |
| 03. විදුලි උපකරණ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 04. බිම්මල් අලෙවිය | 200 0 | 400 0 | 600 0 |
| 05. රෙදි අලෙවිය | 300 0 | 500 0 | 800 0 |
| 06. පාවහන් වෙළෙඳාම | 300 0 | 500 0 | 750 0 |
| 07. සාප්පු බඩු අලෙවිය | 300 0 | 500 0 | 750 0 |
| 35. වෑල්ඩින් කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. ධාන්‍ය වර්ග හෝ මිරිස් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. තීන්ත වර්ග හා වාර්නිෂ් වර්ග විකිණීම හා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. වාහන අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. පරිගණක යන්ත්‍ර මගින් මුද්‍රණ කටයුතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. බිම් මල් වගාව | 500 0 | 750 0 | 1,000 0 |
| 45. බුලත් පුවක් වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. වාහන සේවා ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 47. දුම්කොළ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. සිගරැට් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. බ්ලොක්ගල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 50. වී මෝල් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. විදුලි උපකරණ අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 52. ස්වර්ණාභරණ නිෂ්පාදනය හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. ධාන්‍ය වර්ග අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 55. පපඩම් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 56. වාහන දුම් පරීක්ෂණ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 57. හුණු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### ඉඩම් සංවර්ධනය පිළිබඳ යෝජනාව - 2014

දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6.1.5 (x) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

***බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම්වල පස් හෝ වෙනත් ද්‍රව්‍ය යොදා සංවර්ධනය කිරීමේදී අදාළ ගාස්තු අය කිරීම***

බල ප්‍රදේශයේ තුළ පිහිටි ඉඩම්වල පස් හෝ වෙනත් ද්‍රව්‍ය යොදා සංවර්ධනය කිරීමේදී අදාළ අනෙකුත් ආයතනවල නිර්දේශයන්ට යටත්ව ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තියේ සහ 19 (xxxii) උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතලවලට අනුව පහත උපලේඛනයේ ගාස්තු අය කිරීමට මෙම සභාවට යෝජනා කර සිටිමි. පර්චස් 10 ක් දක්වා ඉඩම් ගොඩ කිරීමේදී අඩු ආදායම්ලාභියෙක් නම් වර්ග මීටර් 01 කට රු. 30 ක මුදලක් අය කිරීමට කටයුතු කරනු ලැබේ.

*ගාස්තු අය කිරීම*

| *ක්ෂේත්‍ර ඵලය* | *පස් සඳහා (රු).* | *වෙනත් ද්‍රව්‍ය සඳහා (රු.)* |
|---|---|---|
| පළමු මී. මී. 300 දක්වා (වර්ග මීටරයක් සඳහා) | 100 | 150 |
| මී. මී. 300 සිට මී. මී. 750 දක්වා (වර්ග මීටරයක් සඳහා) | 400 | 500 |
| මී. මී. 750 සිට මී. මී. 1500 දක්වා (වර්ග මීටරයක් සඳහා) | 600 | 700 |

11-135/13

---

## අකුරැස්ස ප්‍රාදේශීය සභාව

### 2014 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2013.08.23 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 06.01 (xii) යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයි. ඩී. ඉදුනිල් ජයවීර,
සභාපති,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2013 සැප්තැම්බර් මස 30 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් ; හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක ; හෝ
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය හෝ වගා කිරීමට යටත් බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 60%ට වඩා අඩුවන්නේ නම් එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2014 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2014 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර අකුරැස්ස ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් විධාන කළ යුතු යැයි අකුරැස්ස ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

11-133/6

---

## අකුරැස්ස ප්‍රාදේශීය සභාව

### අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2013.08.23 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 06.01(xiii) යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයි. ඩී. ඉදුනිල් ජයවීර,
සභාපති,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2013 සැප්තැම්බර් මස 30 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

**යෝජනාව**

අකුරැස්ස ප්‍රාදේශීය සභාව මගින් පිළිගෙන ඇති 1988 අගෝස්තු 23 වැනි දින අංක 520/7 දරන විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල (21) වැනි අතුරු ව්‍යවස්ථාවේ පළමු වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත් කළ යුතු අප්‍රසන්න හා අන්තරායදායක වෙළෙඳ ව්‍යාපාරවලට අදාළ උපලේඛනය මේ සමග ඉදිරිපත් කරන අතර එම උපලේඛනයේ සඳහන් ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරායදායක වෙළෙඳ ව්‍යාපාර ලෙස සැලකීම සුදුසු යැයි මෙම සභාවට යෝජනා කරන්නීය.

***උපලේඛනය***

1. ශීත කළ මාළු වෙළඳාම
2. යෝගට් නිෂ්පාදනය
3. කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම
4. අවමංගල්‍ය සේවා සපයන ආයතන
5. මළමිණී සකස් කරන ආයතන (එම්බාම් කරන ස්ථාන)
6. අයිස්ක්‍රීම් නිපදවන ස්ථාන
7. වාහන සර්විස් කරන ස්ථාන
8. හුණු පිළිස්සීම හා ගබඩා කරන ස්ථාන
9. කොප්පරා නිපදවන ස්ථාන
10. පොල්තෙල් සෑදීමේ ස්ථානයක් පැවැත්වීම
11. කෘත්‍රිම දත් සකස් කරන ස්ථාන හෝ දත් ගලවන ස්ථාන
12. ගල්වලක් පවත්වාගෙන යාම
13. ගල්මෝලක් පවත්වාගෙන යාම
14. වෙල්ඩින් වැඩපලක් පැවැත්වීම
15. කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවි කරන ස්ථාන
16. ඇසිඩ් වර්ග නිපදවන ස්ථාන
17. ගිණිකෙළි භාණ්ඩ නිපදවීම, විකිණීම
18. පොහොර වෙළෙඳසැල්
19. ප්ලාස්ටික් ෆයිබර් ග්ලාස් නිපදවන ස්ථාන
20. රන්, රිදී ලෝහ ආලේපනය කරන ස්ථාන

11-133/7

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 6.1.5(IV) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද එම බලපත්‍ර ගාස්තුව එම වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවා බලපත්‍රය ලබා ගත යුතු බවටත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 14 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දික්වැල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ, මෙකී උපලේඛනයේ I වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2014 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වැනි තීරයේ නිරූපිත යම් සීමාවන් ඇතුළත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි ;සහ

2013 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථොක්ත බලපත්‍ර ගාස්තුව 2014 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට දෙසැම්බර් 31 දක්වා කාලයට වලංගු වන පරිදි 2014 මාර්තු 31 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවා බලපත්‍රයක් ලබා ගත යුතු යැයි විධාන කිරීමට යෝජනා කරමි.

*උපලේඛනය*

| | *I වැනි තීරුව* *කර්මාන්තය* | *II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 දක්වා* | *රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 ට නොවැඩි* | *රු. 1,500 ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | සංචාරක වෙළෙන්දන් විසින් ආහාර ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම | 250 0 | 300 0 | 500 0 |
| 2. | ආහාර ද්‍රව්‍ය අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | තේ/කෝපි කඩ | 300 0 | 400 0 | 500 0 |
| 4. | බේකරි | 300 0 | 500 0 | 750 0 |
| 5. | සත්ව ගොවිපල | 300 0 | 750 0 | 1,000 0 |
| 6. | කලු ගල් මෝල | 600 0 | 800 0 | 1,000 0 |
| 7. | කළු ගල් කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | යාන්ත්‍රික වඩු මඩු | 600 0 | 800 0 | 1,000 0 |
| 9. | කොහු මෝල් | 600 0 | 800 0 | 1,000 0 |
| 10. | සත්ව ආහාර ගබඩා කිරීම | 600 0 | 800 0 | 1,000 0 |
| 11. | බාබර් සාප්පුව | 300 0 | 500 0 | 700 0 |
| 12. | ගරාජයක් පවත්වාගෙන යාම | 600 0 | 800 0 | 1,000 0 |
| 13. | ඉංග්‍රීසි/සිංහල බෙහෙත් විකිණීම | 600 0 | 750 0 | 1,000 0 |
| 14. | පොල්තෙල් මෝල | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ගෑස් ගබඩා කිරීම/විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ගඩොල් පෝරණු පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 800 0 |
| 17. | යකඩ තලන කම්මල පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 18. | යකඩ නිකල් කිරීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | සිනමා ශාලාවක් පවත්වාගෙන යාම | 600 0 | 800 0 | 1,000 0 |
| 21. | වාහන සේවා කිරීමේ ස්ථානය | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ලැගුම්හලක් පවත්වාගෙන යාම | 600 0 | 800 0 | 1,000 0 |
| 23. | බෝට්ටු වැඩපලක් පවත්වාගෙන යාම | 600 0 | 800 0 | 1,000 0 |

| | I වැනි තීරුව කර්මාන්තය | II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 දක්වා | රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 ට නොවැඩි | රු. 1,500 ට වැඩි |
|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 24. | බේකරි කෑම අලෙවි කරන ස්ථානය | 600 0 | 800 0 | 1,000 0 |
| 25. | මුද්‍රවන ලද කිරි නිෂ්පාදනය/අළෙවිසැල් පවත්වාගෙන යාම | 600 0 | 800 0 | 1,000 0 |
| 26. | සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ටින්කර් වැඩපලක් පවත්වාගෙන යාම | 600 0 | 800 0 | 1,000 0 |
| 28. | ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙන යාම | 600 0 | 800 0 | 1,000 0 |
| 29. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | බීම කර්මාන්ත ශාලා | 600 0 | 800 0 | 1,000 0 |
| 32. | කිරි පට්ටි | 200 0 | 300 0 | 400 0 |
| 33. | අයිස් කර්මාන්ත ශාලා | 600 0 | 800 0 | 1,000 0 |
| 34. | බත් කඩ, ආපනශාලා | 300 0 | 500 0 | 750 0 |
| 35. | හෝටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | නවාතැන් ශාලාවල් | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | ලොන්ඩරි | 200 0 | 300 0 | 500 0 |
| 38. | අවමංගල්‍ය සේවා සැපයුම් | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | පොදු වෙළඳපලවල් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | මස් , බිත්තර පිණිස කුකුළන් ඇති කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | වී මෝල් | 500 0 | 800 0 | 1,000 0 |
| 42. | වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 600 0 | 750 0 | 1,000 0 |
| 43. | ලියවන පට්ටල් වැඩපල | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | පපඩම්, නූඩ්ල්ස්, වෙනත් ආහාර නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | රසකැවිලි නිෂ්පාදනය | 200 0 | 300 0 | 500 0 |
| 46. | ලී මෝල් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | ඩීසල්, පෙට්‍රල්, ලාම්පු තෙල් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | වඩුමඩු | 500 0 | 600 0 | 1,000 0 |
| 49. | වැල්ඩින් වැඩපල | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | නරක්විය හැකි ආහාර ද්‍රව්‍ය විකිණීම | 200 0 | 400 0 | 600 0 |
| 51. | ආහාර ද්‍රව්‍ය ගබඩාකර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | ත්‍රිවීලර් අලුත්වැඩියාව | 500 0 | 700 0 | 1,000 0 |
| 53. | මාළු වියළීම | 500 0 | 700 0 | 1,000 0 |
| 54. | පිහිනුම් තටාක - වර්ග අඩි 200, 300, 500 | 500 0 | 700 0 | 1,000 0 |

*සැලකිය යුතුයි :-*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය අනුව දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් ස්ථානයක හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන්පලක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නේ ද, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පොළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, අවස්ථාවක 2014 වර්ෂයට අයකරන වාර්ෂික බලපත්‍ර ගාස්තුව අයකරනු ලබන අවුරුද්දට පෙරාතුව වූ අවුරුද්දේ ආපන ශාලාව, හෝටලය හෝ නවාතැන්පොළේ ආදායමින් සියයට එකක් (1%)ක් නොඉක්මවිය යුතුය. ඉහත බලපත්‍ර ගාස්තුව නියම කිරීම සඳහා හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පොළක් ගත වූ වර්ෂයේ සම්පූර්ණ ආදායම් විස්තරය අයිතිකරු, කළමනාකරු හෝ වෙනත් ගණකාධිකාරි හෝ වෙනත් බලයලත් අයෙකු විසින් දික්වැල්ල ප්‍රාදේශීය සභාවට වර්ෂයක් පාසා ඉදිරිපත් කළ යුතුය.

11-135/4

---

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 6:1:5(v) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද එම කර්මාන්ත බද්ද එම වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර,

*(අ)* දික්වැල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල 2014 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන්, එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ කර්මාන්ත බද්දක් 2014 වර්ෂයේ දී පනවා අය කිරීමට,

*(ආ)* 2013 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථොක්ත බද්ද 2014 මාර්තු 31 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය හැකි යුතු යැයි විධාන කිරීමට ; සහ

*(ඇ)* 2014 වර්ෂයේදී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද කර්මාන්තය ආරම්භකරන අවස්ථාවේ ම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට යෝජනා කරමි.

*උපලේඛනය*

| | *I වැනි තීරුව* *කර්මාන්තය* | *II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 දක්වා* | *රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 ට නොවැඩි* | *රු. 1,500 ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | මහන මැෂින් අළුත්වැඩියාව | 300 0 | 400 0 | 500 0 |
| 02. | පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 |
| 03. | ඔරලෝසු අලුත්වැඩියාව | 250 0 | 350 0 | 500 0 |
| 04. | පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | ටයර් ටියුබ් අලුත්වැඩියා කිරීම හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | පරිගණක යන්ත්‍ර අලුත්වැඩියාව | 300 0 | 400 0 | 500 0 |
| 07. | විදුලි උපකරණ අලුත්වැඩියාව | 400 0 | 500 0 | 750 0 |
| 08. | ගුවන් විදුලි යන්ත්‍ර/රූපවාහිනී අලුත්වැඩියාව | 400 0 | 500 0 | 750 0 |
| 09. | වියළි ආහාර ද්‍රව්‍ය පැකට් කිරීම | 300 0 | 600 0 | 900 0 |
| 10. | ජංගම දුරකථන අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 11. | දැන්වීම් පුවරුව/ නාම පුවරු සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 12. | බීරළු/කැටයම් වැඩපලක් පවත්වාගෙනයාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | පොල් ලී මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ලොරි බොඩි ගැසීම හා අලුත්වැඩියාව | 100 0 | 200 0 | 300 0 |
| 15. | ටේලර් සාප්පු පවත්වාගෙන යාම | | | |
| | (1) මැෂින් 1-5ට අඩු | 300 0 | 400 0 | 500 0 |
| | (2) මැෂින් 5ට වැඩි | 500 0 | 750 0 | 750 0 |
| 16. | කුෂන් වැඩපල | 250 0 | 500 0 | 1,000 0 |
| 17. | පාවහන් අලෙවිය හා නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

11-135/5

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2014

දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 6.1.5(II) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 14 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ -

154(1) උපවගන්තිය අනුව දික්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලබන ලැබෙන මුදලින් 01% බද්දක් විකුණුම්කරු, වෙන්දේසිකරු හෝ ඔහුගේ අනු නියෝජිතයා විසින් දික්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු අතර 154(2)(1) වගන්තිය අනුව බද්ද ඉල්ලා සිටීමෙන් පසුව දින 14ක් ඇතුලත ගෙවනු නොලැබුවහොත් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් පැහැර හැරීම සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව අයකළ යුතු යයි යෝජනා කරමි.

11-135/3

---

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### පොළ ගාස්තු අයකිරීම සහ ප්‍රාදේශීය සභාව සතු බිම් බදු දීම - 2014

දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6.1.5 (XI)යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***යෝජනාව***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 සමඟ කියවිය යුතු 126 (xii) වගන්තිවලින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 02 වැනි වගන්තිය යටතේ ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව සකස් කරන ලද 1988.08.23 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් අතුරු ව්‍යවස්ථා 2008.09.23 වැනි දින දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මහා සභාව විසින් පිළිගෙන ඇති අතර, එහි සඳහන් 33 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ පොදු වෙළඳ පොළින් පහත සඳහන් ගාස්තු අයකිරීම සුදුසු බව යෝජනා කරමි.

***පොළ ගාස්තු අය කිරීම (සේවා ගාස්තු අතුළුව)***

| | | රු. ශත |
|---|---|---|
| 1. | ආවරණය සහිත එළවළු කඩ අල්ලියක් සඳහා | 150 0 |
| 2. | ආවරණය රහිත එළවළු කඩ අල්ලියක් සඳහා | 100 0 |
| 3. | ආවරණය සහිත සිල්ලර කඩ අල්ලියක් සඳහා | 150 0 |
| 4. | ආවරණය රහිත සිල්ලර කඩ අල්ලියක් සඳහා | 100 0 |
| 5. | ආවරණය රහිත පළතුරු කඩ අල්ලියක් සඳහා | 100 0 |
| 6. | ආවරණය සහිත රෙදි කඩ අල්ලියක් සඳහා | 150 0 |
| 7. | ආවරණය රහිත රෙදි කඩ අල්ලියක් සඳහා | 100 0 |
| 8. | වාහනය මගින් වෙළඳාම් කරයි නම් (වාහනයට ) | 100 0 |
| 9. | වෙනත් සුළු වෙළඳාම් සඳහා | 50 0 |

***ප්‍රාදේශීය සභාව සතු බිම් බදු දීම***

| | |
|---|---|
| වෙළඳ කාර්යය සඳහා (සේවා ගාස්තු රහිතව) | 2,000 0 |
| වෙළඳ කාර්යය නොවන (සේවා ගාස්තු රහිතව) | 1,000 0 |

11-135/11

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් දෘෂ්‍ය පරිසරය (සම්මත අතුරු ව්‍යවස්ථා අංක 39 කොටස) - 2014

දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6.1.5(viii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ දී ය.

### යෝජනාව

දෘෂ්‍ය පරිසරය 2013 වර්ෂය (සම්මත අතුරු ව්‍යවස්ථා අංක 39 කොටස) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122,126 vii(ඊ) වැනි වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/07 දරන පළාත් පාලන *අති විශේෂ ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් වැළඳගන්නා ලද අතුරු ව්‍යවස්ථානුකූලව දික්වැල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුල ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2014.01.01 වැනි දින සිට නැවත සංශෝධනය කරන තුරු 2014 වර්ෂය සඳහා අයකිරීම සුදුසුයැයි යෝජනා කරමි.

*උපලේඛනය*

| *අනු. අංකය* | *අවසර පත්‍රය* | *මාස 03කට හෝ ඊට අඩු රු. ශ.* | *මාස 03 කට වැඩි හෝ වර්ෂයකට රු. ශ.* |
|---|---|---|---|
| 01 | බිත්තියක හෝ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා නිවසේ/ගොඩනැගිල්ලේ/ව්‍යාපාරික ස්ථානයට/වහලයේ (ස්ථිර) වර්ග අඩියකට | 75 0 | 75 0 |
| 02 | මහජනතාවගේ දැන ගැනීමට හැකිවන පරිදි මහා මාර්ගයේ යම් තැනක සවි කර තිබෙන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් සඳහා වර්ග අඩියකට | 20 0 | 50 0 |

11-135/12

---

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම - 2014

දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6.1.5(xii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශීය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකු ම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම, 2014 වර්ෂය සඳහා වන මෙම බද්ද දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2014 වර්ෂයේ දී පහත උප ලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම, එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක්, 2014 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී බලපත්‍රය 2014 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර ලබා ගත යුතු බවටත් යෝජනා කරමි.

*උපලේඛනය*

| | රු. ශත |
|---|---|
| 1. මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| 2. සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| (අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) වෙළඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම් | 4 0 |
| සෑම කරත්තයක් සඳහා | 20 0 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| සෑම ඇතෙකු සඳහා | 50 0 |
| 3. කුලී රථයක් සඳහා (එක් මසක් සඳහා) | 200 0 |

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, විල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළෙඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

11-135/9

---

**දික්වැල්ල ප්‍රාදේශීය සභාව**

ව්‍යාපාර බද්ද පැනවීම - 2014

දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6.1.5 (VI) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද එම ව්‍යාපාර බද්ද එම වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

*1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ :*

(අ) (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මෙහි උපලේඛනයේ පළමුවන කොටසේ නිරූපිත යම් ව්‍යාපාරයක් 2014 වර්ෂයේ දී පවත්වා ගෙන යනු ලබන සෑම තැනැත්තෙකු මත එකී ව්‍යාපාරයේ 2013 වර්ෂයේ ආදායම දෙවන කොටසේ (1) වන තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක (11) වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක් පනවා අය කිරීමට සහ,

(ආ) (3) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් යථොක්ත බද්ද 2014 මාර්තු 31 දිනට ප්‍රථම දික්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යයි, නියම කිරීමට යෝජනා කරමි.

*උපලේඛනය*

*පළමුවන කොටස*

ව්‍යාපාරය

*මෙම ව්‍යාපාර බදු මුදල් අදාල වන්නේ :*

1. උකස් බඩු ගන්නවුන්
2. සැපයුම්කරුවන්
3. වෙන්දේසිකරුවන්
4. බැංකු හා රක්ෂණ නියෝජිතයන්
5. රැකියා ඒජන්සි ආයතනකරුවන්
6. රේස් ඔට්ටුපල
7. පුද්ගලික පන්ති පවත්වන්නවුන්

8. කොන්ත්‍රාත්කරුවන්/බ්‍රෝකර්වරුන්
9. රියැදුරු පුහුණු කරන ආයතන
10. රටබීම හා බීර සාප්පු පවත්වාගෙන යාම
11. ඇඟළුම් කර්මාන්ත ශාලා/කර්මාන්ත ශාලා
12. කොමිස් ඒජන්තවරුන්
13. බ්‍රෝකර්කරුවන්
14. මුදල් ණයට දෙන්නන්
15. ප්‍රවාහන නියෝජිතයින්
16. නොතාරිස්වරුන්
17. මුදල් ආයෝජකයන්
18. රක්ෂණ නියෝජිතයින්
19. වාහන වෙළඳසැල් හිමියන්
20. දුරකථන කුළුණක් පවත්වාගෙන යාම
21. පරණ ලෝහ භාණ්ඩ ගබඩා කිරීම
22. පූජා භාණ්ඩ විකිණීම
23. මැණික් වෙළඳාම
24. සාප්පු බඩු වෙළඳාම
25. සම්බෑග්/නෙට් වර්ග වෙළඳාම
26. සිමෙන්ති විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27. මහන මැෂින් අලෙවිය
28. ඇලුමිනියම්/ප්ලාස්ටික් අලෙවිය
29. පුවත්පත්/පොත්/පාසල් උපකරණ/ලිපිද්‍රවය අලෙවිය
30. උත්සව භාණ්ඩ බදු දීම
31. බුලත්/පුවක් අලෙවි සැලක් පවත්වාගෙන යාම
32. රෙදි වෙළඳ සැලක් පවත්වාගෙන යාම
33. ටොයිස් බඩු අලෙවි සැලක් පවත්වාගෙන යාම
34. විදුලි උපකරණ අලෙවි සැලක් පවත්වාගෙන යාම
35. පාපැදි අලෙවි සැලක් පවත්වාගෙන යාම
36. වීදුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37. ටයර් ටියුබ් ගබඩා කිරීම
38. තීන්ත වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39. කොප්පරා මිලට ගැනීමේ ස්ථානය
40. ලොතරැයි ටිකට් අලවෙිසැල
41. මැටි වළං/විසිතුරු බඩු විකිණීමේ ස්ථානයක්
42. ලිහිසි තෙල් වර්ග කිරීම
43. ටයිල් වර්ග විකිණීම
44. පිත්තල භාණ්ඩ අලවෙිය
45. පුද්ගලික වෙළඳසැලක් පවත්වාගෙන යාම
46. මුදල් අයකර පෙර පාසලක් පවත්වාගෙන යාම
47. යතුරු පැදි අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
48. වාහන අමතර කොටස් අලෙවිය
49. පෞද්ගලික දුරකථන සේවා හා ඡායා පිටපත්
50. යකඩ බඩු ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය
51. ධීවර ආම්පන්න විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
52. පාසැල්/ලිපි ද්‍රව්‍ය වෙළඳ සැලක් පවත්වාගෙන යාම
53. වැලි ගඩොල් විකිණීම
54. ලී වෙළඳ සැල
55. පලතුරු විකිණීම
56. එළවළු වෙළඳාම
57. ගෘහ භාණ්ඩ අලෙවිය
58. උළු/යකඩ/සිමෙන්ති ගබඩා කිරීම
59. වෛද්‍ය මධ්‍යස්ථාන
60. පරිගණක පාඨමාලා පවත්වාගෙන යාම
61. දැව ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
62. ඩීසල් පොම්ප අලුත්වැඩියාව
63. ගීත පටිගත කිරීමෙ හා වීඩියෝ පට බදු දීම
64. පාවහන් නිෂ්පාදනය හා අලෙවිය
65. ආහාර ද්‍රව්‍ය ගබඩා කර විකිණීම
66. කෙසෙල් කැන් විකිණීම
67. ඇස් කණ්නාඩි වෙළඳසැලක් පවත්වාගෙන යාම
68. විදුලි උපකරණ අමතර කොටස් විකිණීම
69. ආයුර්වේද බෙහෙත් ශාලා

*දෙවන කොටස*

| | *I වැනි තීරය* <br> *2013 වර්ෂයේ දී ව්‍යාපාරයේ අදායම :* | *II වැනි තීරය* <br> *රු. ශත* |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවූ අවස්ථාවක | කිසිවක් නැත |
| 2. | රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවුන අවස්ථාවක | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවුන අවස්ථාවක | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන එහෙත් ට රු. 75,000 නොඉක්මවුන අවස්ථාවක | 360 0 |
| 5. | රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවුන අවස්ථාවක | 1,200 0 |
| 6. | රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

විවිධ ආහාර වර්ග ගබඩාකර විකුණන අධිශීතකරණයක සන අඩියක් රු. 50 බැගින් මුදල් ගෙවිය යුතුය.
විවිධ මස් වර්ග මාළු වර්ග විකුණන අධිශීතකරණයක සන අඩියක් රු. 25 බැගින් ගෙවිය යුතුය.

11-135/6

---

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම - 2014

දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6.1.5 (vii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද එම සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද එම වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (I) වන උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක :

*(අ)* ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ
*(ආ)* ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ
*(ඇ)* ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ ඉඩම ඇති අනුපාතය 3:2ට වඩා අඩුවන්නේ නම් ,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම මත 2014 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 02%ක වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2014 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර දික්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යයි යෝජනා කරමි.

11-135/7

---

**දික්වැල්ල ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 6.1.5 (I) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2014 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක වට්ටමක්ද එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයෙන් අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවනු ලැබේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 14 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 1:-

(අ) 146 වන වගන්තියේ (I) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපළ සහ 2013 විෂයේ ගරු අමාත්‍යතුමා අනුමත කර ඇති පරිදි නව තක්සේරුව සඳහා ද, 2013 වර්ෂයේ දී බලපැවැත්වූ වාර්ෂික වටිනාකම 2014 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමට,

(ආ) 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දික්වැල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපළක නවතක්සේරු වාර්ෂික වටිනාකමින් සියයට හයකින් (6%) වරිපනමක් 2014 වර්ෂයේදී පනවා අය කිරීමට, සහ

(ඇ) 134 වන වගන්තියේ (6) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථොක්ත වාර්ෂික වරිපනම් 2014 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු 04 තුළදී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට යෝජනා කරමි.

තවද මෙම පනතේ 134(7) වන වගන්තිය ප්‍රකාර එකී වාර්ෂික බදු මුදල පහත සඳහන් පරිදි සම්පූර්ණයෙන් ගෙවූ විට මෙහි දැක්වෙන වට්ටම් මුදල ප්‍රදානය කිරීම සුදුසු බවද යෝජනා කරමි.

(අ) 2014.01.31 දිනට හෝ ඊට පෙර මුළු වර්ෂයටම ගෙවිය යුතු වරිපනම් බදු ගෙවනු ලැබුවහොත් එම මුදලින් 10%ක්,

(ආ) බදු මුදල් කොටස් වශයෙන් ගෙවන විට බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමුවන මාසය තුළ ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් 5%ක්

11-135/1

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### විනෝද බදු ආඥාපනත හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත අනුව බදු පැනවීම - 2014

දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6.1.5 (ix) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

විනෝද බදු ආඥාපනතේ 02 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලපත ප්‍රකාර දික්වැල්ල ප්‍රාදේශීය සභාව, සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් 20% ක සමාන බද්දක් පනවා අය කල යුතු යැයි ද මෙම සභාවට යෝජනා කරමි. තව ද විහාරස්ථානයක පුණ්‍ය කටයුත්තක් හෝ විද්‍යාලක පුස්තකාල හෝ සංවර්ධන කටයුතු වෙනුවෙන් පෙන්වනු ලබන දර්ශන පිළිගත හැකි සාක්ෂි මත රැගුම් පාලනයේ අනුමැතිය පරිදි විනෝද බද්දෙන් නිදහස් කළ යුතු බව ද යෝජනා කරමි.

එසේ වුව ද සිනමාශාලාවලින් අයකරනු ලබන විනෝද බදු ගරු අමාත්‍යතුමා අනුමත කර ඇති පරිදි 7.5% ක මට්ටමක් විය යුතු බවට යෝජනා කරමි.

11-135/8

---

## දැරණියගල ප්‍රාදේශීය සභාව

### රථ වාහන නවතා තැබීම සඳහා ගාස්තු අය කිරීම - 2014

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වගන්ති/126 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර 2009 දෙසැම්බර් 18 වැනි දින ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව 2010.01.22 වැනි දින අංක 1,638 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ හි නිවේදනයක් මගින් දැරණියගල ප්‍රාදේශීය සභාවේ පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාව අනුව දැරණියගල ප්‍රාදේශීය සභාවේ අනුමත ත්‍රීරෝද රථ නැවතුම්පල ලියාපදිංචි කිරීම සඳහා හා අනෙකුත් රථ වාහන වලින් පහත දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් අය කිරීමට 2013 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5 යටතේ යෝජනා සභා සම්මත තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

01. *ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලත් ත්‍රීවිල් රථ වලින් අය කරනු ලබන ගාස්තු :*

| | රු. ශත |
|---|---|
| වාර්ෂික ගාස්තුව (ස්ටිකරය සමග) | 250 0 |
| මාසික අවසර පත්‍ර ගාස්තුව | 150 0 |

02. *සභා අනුමැතිය ලත් ත්‍රීවිල් හැර අනෙකුත් වාහන වලින් අය කරනු ලබන ගාස්තු :*

| | *වාහන වර්ගය* | *අය කරනු ලබන ගාස්තුව* රු. ශත |
|---|---|---|
| 01. | වෑන්, කාර්, ජීප් රථ, කැබ් රථ, මෝටර් රිය, ත්‍රීරෝද රථ, | 30 0 |
| 02. | බස් රථ (ලංගම හැර) ලොරි, ටිපර් රථ ට්‍රේලර් සහිත වෙනත් වාහන | 40 0 |
| 03. | වෙනත් මෝටර් වාහන | 50 0 |
| 04. | යතුරු පැදි | 20 0 |

ඩබ්. ඒ. අනුර විජේසූරිය,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 11 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-132/13

---

## දැරණියගල ප්‍රාදේශීය සභාව

### ඉරිදා සති පොල ගාස්තු අය කිරීම - 2014

2014 වර්ෂය සඳහා දැරණියගල ප්‍රාදේශීය සභාවේ ඉරිදා සති පොල වෙළඳුන්ගෙන් පහත දක්වා ඇති පරිදි ගාස්තු ප්‍රමාණයන් අය කිරීමට 2013 වර්ෂයේ සැප්තැම්බර් මස 26 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5 යටතේ යෝජනා සභා සම්මත තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

| *වෙළඳ ස්ථානයේ ස්වභාවය* | *දිනක ගාස්තුව* රු. ශත |
|---|---|
| වෙන් කරන ලද පරිශ්‍රය සඳහා (ස්ථිර කඩ කාමර සඳහා) 7 x 8 වර්ග ප්‍රමාණය | |
| එළවළු, අල, ලූණු | 200 0 |
| පලා වර්ග, දුංකොළ, වෙනත් | 100 0 |
| ආපනශාලාව, මාළු වෙළඳාම | 250 0 |
| තාවකාලික වෙළඳාම සඳහා (පදික වෙළඳාම) | |
| රෙදි කඩ | 100 0 |
| පොල් වෙළඳාම | 50 0 |
| රස කැවිලි වෙළඳාම, පළතුරු, ප්ලාස්ටික්, වෙනත් | 20 0 |

ඩබ්. ඒ. අනුර විජේසූරිය,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 11 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-132/14

### දැරණියගල ප්‍රාදේශීය සභාව

සභාව සතු ක්‍රීඩා භූමි කුළියට දීමේ ගාස්තු අය කිරීම - 2014

දැරණියගල ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා භූමි කුළියට දීමේ දී පහත දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් අය කිරීමට 2013 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 5 යටතේ යෝජනා සහා සම්මත කර තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඒ. අනුර විජේසූරිය,<br>
සභාපති,<br>
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 11 වැනි දින,<br>
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

01. පොදු වෙළඳපළ අසල ක්‍රීඩාපිටිය :

වර්ග අඩි 50 ට අඩු ප්‍රමාණයක් නම් දිනකට රු. 100 බැගින් ද,
වර්ග අඩි 50 ට වැඩි ප්‍රමාණයක් නම් වර්ග අඩියට රු. 2 බැගින් දින ගණනට අය කරනු ලැබේ.

02. ප්‍රාදේශීය සභාව පිටුපස ඇති ක්‍රීඩා පිටිය සඳහා දිනකට රු. 5,000 බැගින්.

11-132/10

---

### දැරණියගල ප්‍රාදේශීය සභාව

අයකරනු ලබන අයදුම්පත්‍ර ගාස්තු හා වෙනත් අයකිරීම්

දැරණියගල ප්‍රාදේශීය සභාවේ 2014 ජනවාරි 01 දා සිට 2014 දෙසැම්බර් 31 දක්වා කාලය තුල පහත දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් අය කිරීමට 2013 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5 යටතේ යෝජනා කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඒ. අනුර විජේසූරිය,<br>
සභාපති,<br>
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 11 වැනි දින,<br>
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | ගොඩනැගිලි අයදුම්පත්‍ර | 750 0 |
| 02. | ගොඩනැගිලි අනුකූලතා සහතිකය | 1,000 0 |
| 03. | ගොඩනැගිලි අයදුම්පත් කාලය දීර්ඝ කිරීමේ ගාස්තුව | 200 0 |
| 04. | දේපල අයිතිය ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය | 500 0 |
| 05. | වීථි රේඛා අයදුම්පත් ගාස්තුව | 150 0 |
| 06. | වීථි රේඛා සහතික පත් ගාස්තුව | 1,000 0 |
| 07. | පුස්තකාල අයදුම්පත් ගාස්තුව (තැන්පත් මුදල රු. 100 ) | 25 0 |
| 08. | පුස්තකාල දඩ (දිනකට) | 0.50 |
| 09. | ජල අයදුම්පත් ගාස්තුව - | |
| | ගෘහස්ත (තැන්පත් මුදල රු. 500 ) | 150 0 |
| | වෙළඳ (තැන්පත් මුදල රු. 750 ) | 250 0 |
| 10. | අනතුරු ගස් ඉවත් කිරීමේ අයදුම්පත් - | |
| | කොස් ගස් සඳහා | 350 0 |
| | කොස් නොවන වෙනත් ගස් | 250 0 |
| 11. | ජල ගිවිසුම් පත්‍ර ගාස්තු | 25 0 |
| 12. | පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු | 750 0 |
| 13. | පරිසර බලපත්‍ර ගාස්තුව | 4,000 0 |
| 14. | පරිසර අයදුම්පත්‍ර ගාස්තු (නව කර්මාන්ත සඳහා) | 100 0 |
| | (බලපත්‍ර අලුත්කිරීම සඳහා) | 50 0 |
| 15. | පාපැදි අයදුම්පත් ගාස්තු | 4 0 |
| 16. | පාපැදි බලපත්‍ර ගාස්තුව | 6 0 |
| 17. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ ඉල්ලුම්පත්‍ර ගාස්තු | 25 0 |
| 18. | වරිපනම් උධෘත නිකුත් කිරීම (එක් වසරකට) | 25 0 |
| 19. | ඡායා පිටපත් කිරීමේ ගාස්තු - තනිපිට | 5 0 |
| | දෙපිට | 7 0 |
| 20. | මිහිදන් කිරීමේ ගාස්තු | 10 0 |
| 21. | ගොඩනැගිලි අයදුම්පත් පරීක්ෂණ ගාස්තු - | |

| *ගෙබිම විශාලත්වය වර්ග අඩි* | *නිවාස සඳහා රු. ශත* | *ව්‍යාපාර සඳහා රු. ශත* |
|---|---|---|
| 483.75 අඩු | 500 0 | 1,000 0 |
| 483-967.50 | 1,500 0 | 2,000 0 |
| 967.50-1161 | 2,500 0 | 3,000 0 |
| 1161-2902.50 | 3,500 0 | 4,000 0 |
| 2902.50-4837.50 | 4,500 0 | 6,000 0 |
| 4837.50-7256.25 | 5,500 0 | 8,000 0 |
| 7256.25-9675.00 | 6,500 0 | 10,000 0 |
| 9675.00-13168.75 | 7,500 0 | 12,000 0 |
| 13168.75 ට වැඩි | 7,500 0 | 12,000 0 |
| | වර්ග අඩි 967.5 ක් වන එක් එක් අමතර ගෙබිම ප්‍රමාණ සඳහා රු.1,000 බැගින් | වර්ග අඩි 967.5 ක් වන එක් එක් අමතර ගෙබිම ප්‍රමාණ සඳහා රු. 1,000 බැගින් |

11-132/9

---

### දැරණියගල ප්‍රාදේශීය සභාව

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2014 වර්ෂය

දැරණියගල ප්‍රාදේශීය සභාවේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා පහත දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් අය කිරීමට 2013 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5 යටතේ යෝජනා සහා සම්මත තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

1. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව එක් අයිතමයක් සඳහා රු. 250 ක් ද;
2. එක් අයිතමයකට වඩා වැඩි වන සෑම අයිතමයක් සඳහා රු. 50 බැගින් ද අය කිරීම.

ඩබ්. ඒ. අනුර විජේසූරිය,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 11 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

132/11

---

## දැරණියගල ප්‍රාදේශීය සභාව

### යන්ත්‍ර සූත්‍ර කුලියට දීම - 2014 වර්ෂය

දැරණියගල ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍ර සූත්‍ර කුලියට දීම සඳහා 2014 ජනවාරි 01 සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා පහත දක්වා ඇති පරිදි ගාස්තු ප්‍රමාණයන් අය කිරීමට 2013 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5 යටතේ යෝජනා සභා සම්මත තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

| *වාහනය/යන්ත්‍රය* | *මිල ගණන රු. ශත* | *කාලය* | *ඉන්ධන* |
|---|---|---|---|
| ලෙලන තලනය | 4500 0 | පෙ. ව. 8.00 - ප.ව. 5.00 දක්වා වැඩ කරන සෑම දිනකටම | රහිතයි |
| ට්‍රැක්ටර් : | | | |
| ට්‍රේලර් රහිතව | | | |
| ස. අ. 75 ට්‍රේලරය සමග | 6,000 0 | පෙ. ව. 8.00 - ප.ව. 5.00 දක්වා වැඩ කරන සෑම දිනකටම | සහිතයි |
| ස. අ. 90 ට්‍රේලරය සමග | | | |
| කොන්ක්‍රීට් මිශ්‍රණය | 4,000 0 | දිනකට | සහිතයි |
| බැක්හෝ ලෝඩරය - ජේසීබී | 2,500 0 | පැයකට (යාමට ගතවන කාලය සමග) | සහිතයි |
| කම්පන තලනය | 2,500 0 | පෙ. ව. 8.00 - ප. ව. 5.00 දක්වා වැඩ කරන සෑම දිනකටම | රහිතව |
| ජල බවුසරය | 7,700 0 | පෙ. ව. 8.00 - ප. ව. 5.00 දක්වා වැඩ කරන සෑම දිනකටම | සහිතව |

ඩබ්. ඒ. අනුර විජේසූරිය,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 11 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-132/12

---

## දැරණියගල ප්‍රාදේශීය සභාව

### 2014 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5 යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව තව දුරටත් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2014 වර්ෂයේ ජනවාරි මස 31 දිනට ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

ඩබ්. ඒ. අනුර විජේසූරිය,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 11 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1967 අංක දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2013 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2014 වර්ෂය සඳහා පිළිගැනීමටත් ;

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට දහයක (10%) වරිපනමක් 2014 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්; සහ

එම වරිපනම් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධානය කිරීමටත් දැරණියගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

### උපලේඛනය

| *බද්දට යටත් වන ප්‍රදේශ :* | *දේපළ බද්ද* | *කසළ බද්ද* |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාර කෑගල්ල ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක සී/4 හා 1968.07.01 දිනැති ලිපියෙන් අනුමත කළ පහත සඳහන් දියුණු ප්‍රදේශ :- | 6% | 4% |
| (1) *දැරණියගල නගර ප්‍රදේශ :* දෙහිඕවිට නුරි පාරේ සැ. 8/9 බෝක්කුවේ සිට 10/3 බෝක්කුව දක්වා පාරේ මැද සිට දෙපසට දම්වැල් 3 බැගින් වූ ප්‍රදේශය | 6% | 4% |
| (2) *විදුහල් ප්‍රදේශය :* දෙහිඕවිට දැරණියගල ප්‍රසිද්ධ පාරේ විදුහල් හන්දියෙන් කි. මී. 14/1 දරන බෝක්කුව අසල සිට දැරණියගල ලිහිණියාගල පාරේ 10 වැනි විදුලි කණුව දක්වා වූ දම්වැල් 38 දිග් අඩි 16ක් දුරට එකී පාරේ මැද සිට දෙපසට දම්වැල් 3 බැගින් වූ ප්‍රදේශය තුළ | 6% | 4% |
| (3) *බෝතොට පාර ප්‍රදේශය :* දෙහිඕවිට ප්‍රසිද්ධ පාරේ කි. මී. 14/3 හා 14/4 දරන බෝක්කුව අතරින් ආරම්භව බෝතොට පොදු සුසාන භූමිය දක්වා වූ පාරේ දම්වැල් 9යි අඩි 30ක් දුරට හා එම පාරේ මැද සිට දෙපසට දම්වැල් 3 බැගින් වූ ප්‍රදේශය තුළ | 6% | 4% |
| (4) *මියනවිට පාර :* දැරණියගල මියනවිට පාර ආරම්භයේ සිට 1/2 බෝක්කුව දක්වා (දේවාල අසල පාළම) දක්වා මැද සිට දම්වැල් 03 බැගින් | 6% | 4% |

11-132/7

### දැරණියගල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වැනි වගන්තිය යටතේ ඉඩම් විකිණීම විෂයයෙහි බදු අය කරගැනීම

ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුළ පිහිටි ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර්කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු නැතහොත් නියෝජිතයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත්, එම විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට එකකට සමාන බද්දක් (මෙම බද්ද ගෙවීම අදාළ ඉඩම් විකුණූ වර්ෂය අවසානයට පෙර විය යුතුය.) 2014 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි පනවනු ලැබේ.

ඩබ්. ඒ. අනුර විජේසූරිය,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 11 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-132/8

---

### දැරණියගල ප්‍රාදේශීය සභාව

ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත (176 වැනි අධිකාරය )

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් බලපත්‍ර ගාස්තු 2014 වර්ෂයේ සිට ඉදිරියට බලපැවැත්වෙන පරිදි පනවනු ලැබේ :

01. තාවකාලික චිත්‍රපටි දර්ශන, මැජික් දර්ශන, සර්කස් දර්ශන, නාට්‍ය දර්ශන, සඳහා එක් දිනකට රු. 100ක් ද, ඊට වැඩි වන සෑම දිනකටම රු. 25ක් බැගින් ද,
